# ලංසු කැඳවීමේ ලේඛනය

**වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ**
**යාපනය උපකාර්යාලය හා දියත්මග සදහා**
**ආරක්ෂක සේවාව - 2025**

**ලංසු අංකය - MSS/ACC/01/07**

**වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යංශය**
**වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

# ලංසු කැඳවීමේ ආරාධනාව

**වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා ආරක්ෂක සේවාව -2025**

**ලංසු අංකය - MSS/ACC/01/07**

1 වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා 2025 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවාව සඳහා සුදුසුකම් ලත් පිළිගත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

2 මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් 2024 දෙසැම්බර් 06 දින සිට 2024 දෙසැම්බර් 17 වන දින දක්වා කාර්යාලීය දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුල වෙළඳ නාවික ලේකම් කාර්යාලය හා යාපනය උපකාර්යාලය පැමිණීමෙන් හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියෙන් (http://www.dgshipping.gov.lk) ලබා ගත හැක.

3 සම්පූර්ණ කරන ලද මුද්‍රා තබන ලද මුල් පිටපත හා අනුපිටපතකින් යුක්ත ලංසු 2024 දෙසැම්බර් 18 දින ප.ව 2.30 ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ලංසු බහාලුමට දැමිය හැකිය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4 සෑම ලංසුවක්ම රු.18,000.00 ක වටිනාකමකින් යුක්ත දින 90 ක වලංගු කාලයක් සහිත ලංසු සුරක්ෂණයකින් සමන්විත විය යුතුය.

5 ආරක්ෂක සේවාව සැපයිය හැකි ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා වැඩිදුර විස්තර වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යජීව මහතා (076-4101335, සුරන්තිරන් මහතා (0777-159423) ඇමතීමෙන් හෝ පහත ලිපිනයන්ට පැමිණීමෙන් ලබාගත හැක.

අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
ටෙක්නිකල් හංදිය,
මරදාන පාර,
කොළඹ 10

වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
යාපනය උපකාර්යාලය,
වෙරළ පාර - බටහිර,
කයිට්ස්,
යාපනය.

<u>ලංසුකරුවන්ට උපදෙස්</u>

1. විෂය පථය

වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා වූ මාස 12 ක කාලයක් සඳහා ආරක්‍ෂක සේවාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවනු ලැබේ.

2. ලංසුකරුවන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද

- රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම පිළිබඳව පසුගිය වසර 10 තුල අඛණ්ඩ වසර 3 ක පලපුරුද්දක් තිබීම.
- ව්‍යාපාරය ලියාපදිංචි කර තිබීම.(ව්‍යාපාර නාම ආඥා පනත/සමාගම් පනත/වෙනත්)
- සේවක සේවිකාවන්ට රජයේ නීති රීති, රෙගුලාසි අනපනත් යටතේ ලබා ගැනීමට හිමිකම් ඇති අවම වැටුප් ප්‍රමාණය හෝ ඊට වැඩියෙන් ගෙවීම් කිරීම.
- සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම රු.මිලියන 2 ඉක්මවිය යුතුය.
- 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ ද්වි වාර්ෂික බල පත්‍රය.

3. ලංසු තැබීමේ පිරිවැය

ප්‍රසම්පාදන අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී වැයවන කිසිදු වියදමක් සඳහා වෙළඳ නාවික ලේකම් කාර්යාලය වගකීමට නොබැඳේ.

4. ආයතන පරීක්ෂාව

2024 දෙසැම්බර් 06 දින සිට 2024 දෙසැම්බර් 17 වන දින දක්වා කාර්යලීය දිනවල (රජයේ වැඩ කරන දිනවල) පෙ.ව 9.00 ප.ව 3.00 දක්වා යාපනය උපකාර්යාලය හා දියත්මග පරිශ්‍රය පරීක්ෂා කළ හැකිය.

5. ලංසුවට ඇතුලත් වියයුතු ලියවිලි

සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත් අත්සන් කර එක් පිටපතක් මුල් පිටපත ලෙසත් දෙවන පිටපත අනු පිටපත ලෙසත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. ලංසුව සමග පහත ලේඛනද ඇතුලත් කල යුතුය.

i. දෛනික මිල ගණන් ප්‍රකාශනයක්
ii. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ලේඛන
iii. වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා යොදාගනු ලබන සේවකයින් ප්‍රමාණය හා ඔවුන්ට ගෙවන වැටුප් පිළිබඳ විස්තරයක්
iv. VAT ලියාපදිංචිය පිළිබඳ ලේඛන (“VAT” සඳහා ලියාපදිංචි වී නොමැත්තේ නම් “VAT” සඳහා ලියාපදිංචි වී නොමැති බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කිරිම)
v. ව්‍යාපාරයේ ලියාපදිංචි සහතික
vi. ලංසු සුරක්ෂණය
vii. පසුගිය ආසන්න වර්ෂ 3හි විගනණය කරන ලද මුල්‍ය වාර්තා

viii. 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ ද්වි වාර්ෂික බල පත්‍රය.

6. ලංසු මිල ගණන්

මිල ගණන් ඉදිරිපත් කිරීමේදී පහත අයිතමයන් සඳහා වියදම් වෙන් වෙන් වශයෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කල යුතුය.

**i.** ආරක්ෂක සේවාව සැපයීමේ දෛනික ගාස්තුව
උපකාර්යාලය සඳහා දිනක වැටුප
දිවා කාලය ......................................
රාත්‍රී කාලය .......................................
දියත්මග සඳහා දිනක වැටුප
දිවා කාලය ......................................
රාත්‍රී කාලය ......................................

ii. මාසික මුළු වටිනාකම

iii. VAT

iv. 2025 වසර සඳහා වූ මාස 12ක මුළු වටිනාකම

7. ලංසු වලංගු කාලය - ලංසු වලංගු කාලය දින 90 කි.

8. ලංසු සුරක්ෂණය

රු.18,000.00ක වටිනාකමින් යුක්ත දින 90 ක වලංගු කාලයක් සහිත ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය.

9. ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීම

මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර අත්සන් කර එක් පිටපතක් මුල් පිටපත ලෙසත් දෙවන පිටපත අනු පිටපත ලෙසත් නම් කර 2024.12.18 වන දින ප.ව. 2.30 ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ඒවිමට හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ලංසු බහාලුමට දැමිය හැකිය. ලිපි කවරයේ වම්පස ***"වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ (යාපනය උප කාර්යාලයේ) ආරක්ෂක සේවාව"*** යනුවෙන් සටහන් කල යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79, ටෙක්නිකල් හංදිය,
මරදාන පාර,
කොළඹ 10.

i. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(තැපැල් ප්‍රමාදයන් හෝ මාර්ගස්ථ ප්‍රමාදයන් සඳහා වගකියනු නොලැබේ)

10. ලංසු විවෘත කිරිම

ලංසු භාර ගැනීම අවසන් වූ වහාම වෙළඳ නාවික ලේකම් කාර්යාලයෙහිදි ලංසු විවෘත කරනු ලැබේ. මේ සඳහා ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහාභාගී විය හැකිය.

1. කාර්යසාධන සුරක්ෂණය

   කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර දින 14 ක් ඇතුලත කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක වටිනාකමක් සඳහා කොන්ත්‍රාත්තුව නිමවන දින සිට දින 28 ක් දක්වා වූ වලංගු කාලයක් සහිත ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබා ගන්නා කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

## <u>කොන්ත්‍රාත් කොන්දේසි</u>

1. අවශ්‍ය කරන සේවකයින් ප්‍රමාණය හා කොන්දේසි
   - දියත් මගෙහි ආරක්ෂාව සඳහා දිවා කාලය සඳහා ජුනියර් ආරක්ෂක නිලධාරී (JSO) කෙනෙකු ගෙන්ද රාත්‍රි කාලය සඳහා ජුනියර් ආරක්ෂක නිලධාරී (JSO) කෙනෙකුගෙන්ද සමන්විය යුතුය.
   - කාර්යාල ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා දිවා කාලය සඳහා කාන්තා ආරක්ෂක නිලධාරී (LSO) කෙනෙකුගෙන්ද රාත්‍රි කාලය සඳහා JSO කෙනෙකුගෙන්ද සමන්විය යුතුය.
   - සේවයේ යොදවනු ලබන සේවකයින්ගේ වයස අවුරුදු 55 ට අඩු විය යුතු අතර ඔවුන්ගේ ශරීර සෞඛ්‍ය තත්වය පිලිබදව වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සෑහීමට පත්විය යුතුය.
   - ආරක්‍ෂක සේවා ආයතනයෙහි නිල ලාංජනය නිරූපනය වන පරිදි වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සෑහීමට පත්වන ආරක්‍ෂක සේවකයන් සඳහා වූ අනුමත නිල ඇඳුමකින් සැරසී සිටිය යුතුය.
   - වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙනුවෙන්ම අඛණ්ඩ සේවයේ යෙදෙන OIC කෙනෙකු හෝ SSO කෙනෙකු අවශ්‍ය නොවන අතර දිනකට අවම වශයෙන් එක් වරක් හෝ පැමිණ අධීක්ෂණ කටයුතු සිදු කළ යුතුය.
   - සේවයේ යොදවනු ලබන සේවකයින් සේවයේ යෙදවීමට පෙර ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබදව වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සෑහීමට පත්විය යුතුය.
   - ආරක්ෂකයින් සඳහා අවශ්‍ය වන වැසි කබා, විදුලි පන්දන් (Torch), ආරක්ෂක උපකරණ ආදිය ආරක්‍ෂක සේවා සපයන ආයතනය විසින් ලබා දිය යුතුය.
   - එක් වැඩ මුරයක් පැය 12කින් සමන්විත විය යුතුය.
   - සියලුම ආරක්ෂක නිලධාරියෙකුහටම ගිනි නිවන උපකරණ, ප්‍රථමාධාර සහ සන්නිවේදන උපකරණ භාවිතා කිරීමේ හැකියාව සහ නිසි දැනුම තිබිය යුතුය.

2. කොන්ත්‍රාත් මුදල

වසරක කාලයක් සඳහා වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් ගෙවිය යුතු මුළු මුදල ඇතුලත් වේ. VAT බදු ලියාපදිංචි අංකයද සඳහන් කල යුතුය.

3. කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම

- ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් අත්තිකාරම් ගෙවනු නොලැබේ.
- කොන්ත්‍රාත්කරු විසින් එක් එක් මාසය අවසානයේදී එම මාසය තුල සේවකයන් සේවයේ යෙදවීම පිළිබඳ පැමිණීමේ ලේඛණයක් සමග ඉන්වොයිසය ඉදිරිපත් කල යුතුය. එම ලේඛණය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු ගෙවීම් කරනු ලැබේ.
- කොන්ත්‍රාත්කරු විසින් යෙදවීමට එකඟ වී ඇති සේවක සංඛ්‍යාවට වඩා වැඩියෙන් සේවයේ යෙදවීම වෙනුවෙන් අතිරේක ගෙවීම් නොකරන අතර අවශ්‍ය වූ විටක කලින් දන්වා ලබා ගන්නා අතිරේක සේවක සංඛ්‍යාවකට සමානුපාතිකව ගෙවීම් සිදු කරනු ලැබේ. අඩුවෙන් සේවකයින් සේවයේ යෙදවීමක් සිදුවුවහොත් සමානුපාතික අඩු කිරීම් සහිතව මාසිකව ගෙවීම් කරනු ලැබේ.

4. පොදු කොන්දේසි

- කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යාමේදී ආරක්ෂක සේවකයින්ට සිදුවන තුවාලවීම් හානි හෝ ජීවිත හානි පිළිබඳව වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත බැදීමක් නොවේ.
- කොන්ත්‍රාත්කරු අදාළ කම්කරු නීති හා රෙගුලාසි අනුකූලව කටයුතු කල යුතුය.
- කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යාමේදී ආරක්ෂක සේවකයින්ගෙන් රජයේ දේපළවලට හානි සිදු වුවහොත් ඒ පිළිබඳව කොන්ත්‍රාත්කරු වගකිව යුතු වන අතර , රජයට අලාභ ගෙවිය යුතු වේ.
- ආරක්ෂක සේවාව නිළධාරීන් ආයතනයේ ලාංජනය සහිත ආරක්ෂක නිළධාරීන් සඳහා වූ අනුමත නිල ඇඳුමකින් සැරසී සිටිය යුතුය.
- අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවක් වේ.
- එකම සේවක සංඛ්‍යාවක් මෙම කාර්යාලයේ සේවයේ යෙදවීම වඩාත් සුදුසු වන අතර මෙම කාර්යාලයට අනුයුක්ත කරනු ලබන සේවකයින් නිතර නිතර වෙනත් ස්ථානවලට අනුයුක්ත කිරීමෙන් වැලකී සිටිය යුතුය. අනුයුක්ත කරන සේවක/සේවිකාවන් මාරු කිරීමට පෙර මෙම කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ බලයලත් නිලධාරියෙකු දැනුවත් කල යුතුය.
- පැමිණීමේ ලේඛන, අනෙකුත් අත්සන් ලේඛන වල ආරක්ෂක නිළධාරීන් හා සුපරික්ෂකවරු අත්සන් තැබිය යුතුය.
- ආයතනය තුල පවත්නා දේපල වලට හානි සිදු කිරීම හා පිටතට ගෙනයාම නොකළ යුතු අතර දේපළ වලට හානි සිදු කිරීම හා පිටතට ගෙනයාම වැලැක්වීමටද කටයුතු කල යුතුය.

## සේවායයාගේ අවශ්‍යතාවයන් (ඉටුකළයුතු කාර්යයන්)

- වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග හි දේපල, සේවකයින් හා ආයතනයට පැමිණෙන සේවාදායකින්ගේ ආරක්ෂාව සහතික කල යුතුය.
- එක් වැඩ මුරයක් පැය 12 ක කාලයක් විය යුතුය.
- සියළුම ආරක්ෂකයින්ට ගිනිනිවීමේ උපකරණ, ප්‍රථමාධාර, සන්නිවේදන උපකරණ භාවිතා කිරීම පිළිබඳව හැකියාවක් හා මනා දැනුමක් තිබිය යුතුය.
- දියත්මග හා කාර්යාලයට පැමිණෙන සියලුම වාහන හා පුද්ගලයන් පිළිබඳව වාර්තාවක් පවත්වා ගත යුතුය.
- දෛනිකව සිදුවන සියලුම කාර්යයන් පිළිබඳව ලොග් සටහන් පොතක් පවත්වා ගත යුතුය.
- දියත්මග හා කාර්යාලය අවට ගැවසෙන සැක කටයුතු වාහන හා පුද්ගලයින් පිළිබඳව විමසිලිමත් වීම.
- විධිමත් අනුමැතියකින් තොරව ආයතනයෙහි හා දියත්මගෙහි උපකරණ බඩු බාහිරාදිය පිටතට ගෙනයාම වැලැක්විය යුතුය.
- දියත්මගෙහි හා ආයතනය තුල නිකරුනේ ගැවසෙන පුද්ගලයින් ඉවත් කිරීම.
- හදිසි අවස්ථාවකදී ක්‍රියා කලයුතු ආකාරය පිළිබඳ මනා දැනුවත් භාවයකින් සිටිය යුතු අතර අදාළ අංශ කඩිනමින් දැනුවත් කල යුතුය.

# මිල ගණන් ප්‍රකාශය

**වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා ආරක්ෂක සේවාව - 2025**

1. ප්‍රසම්පාදන කොන්දේසි හා උපදෙස් කියවා තේරුම් ගැනීමෙන් පසු 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා වූ වර්ෂයක් සඳහා රුපියල් ......................................................+ VAT (රු....................+ VAT) මුලු මුදලකට වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා ආරක්ෂක සේවාව පහත සඳහන් අන්දමට සැපයීමට මෙයින් එකඟ වෙමි. / වෙමු.

| අයිතමය | විස්තරය | මුදල (රු. ශත) |
|---|---|---|
| 1 | උපකාර්යාලය සඳහා දෛනික ගාස්තුව<br>දිවා කාලය<br>රාත්‍රී කාලය<br>දියත්මග සඳහා දෛනික ගාස්තුව<br>දිවා කාලය<br>රාත්‍රී කාලය | |
| 2 | වෙනත්<br>………………………….. | |
| 3 | ආරක්ෂකසේවාව සැපයීම වෙනුවෙන් VAT රහිත දෛනික ගාස්තුව | |
| 4 | "VAT" | |
| 5 | ආරක්ෂකසේවාව සැපයීම වෙනුවෙන් VAT සහිත දෛනික ගාස්තුව | |
| 6 | ආරක්ෂකසේවාව සැපයීම වෙනුවෙන් වාර්ෂික මුදල (දින 365, VAT රහිත) | |

2. මෙම ප්‍රසම්පාදනය දින 90 කාලයක් සඳහා වලංගු වේ. මෙම වලංගු කාලය තුළදී ප්‍රසම්පාදනය ප්‍රදානය කළහොත් ගිවිසුමකට එළඹීමට සූදානමින් සිටින අතරම, ප්‍රසම්පාදන කොන්දේසිවල සඳහන් පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කිරීමට එකඟ වෙමි.

……………………………………………..
කොන්ත්‍රාත්කරුගේ නම හා අත්සන

දිනය :
(නිල මුද්‍රාව තබන්න)

**වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය උපකාර්යාලය හා දියත්මග සඳහා ආරක්ෂක සේවාව -2025**

**අයදුම්පත**

01 කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි නාමය :

1:1 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය :

(ලිපිවල පිටපත් අමුණන්න)

02 .ආයතනයේ ස්වභාවය : (ව්‍යාපාරයේ ස්වභාවය අනුව ඉදිරියෙන් (හරි) ලකුණ යොදන්න.)

I. තනි අයිතිකරු
II. හවුල් ව්‍යාපාර
III. සීමිත සමාගමක්
IV. අනෙකුත්

03. කාර්යාලයීය ලිපිනය:
04. දුරකථන අංකය :
05. ෆැක්ස් අංකය :
06. වැඩි විස්තර දැනගත හැකි නිලධාරියාගේ නම, ලිපිනයන් හා දුරකථන අංකය/ ජංගම දුරකථන අංකය සඳහන් කරන්න

07. ආයතනය පිළිබඳ විස්තර :

දැනට සේවයේ නියුක්ත මුළු ආරක්ෂක නිලධාරීන් ගණන : ..............................................
දැනට සේවා සපයනු ලබන රාජ්‍ය ආයතන ගණන : ..............................................
දැනට සේවා සපයනු ලබන පෞද්ගලික ආයතන ගණන : ..............................................
JSO නිලධාරීන්ට ගෙවන දෛනික වැටුප : ..............................................
LSO නිලධාරීන්ට ගෙවන දෛනික වැටුප : ..............................................
SSO නිලධාරීන්ට ගෙවන දෛනික වැටුප : ..............................................
OIC නිලධාරීන්ට ගෙවන දෛනික වැටුප : ..............................................

08. ආරක්ෂක සේවාව සපයනු ලබන ආයතනයේ සේවක සේවිකාවන්ට රජයේ නීතිරීති, රෙගුලාසි යටතේ ලබාගැනීමට හිමිකමක් ඇති සියලුම වැටුප්, දීමනා, අනෙකුත් වරප්‍රසාද ලබාදෙන බව තහවුරු කිරීම සඳහා 2024 වර්ෂයේ ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාසවලට අදාල ලියකියවිලි ප්‍රසම්පාදන අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. (සේවක අර්ථ සාධක අරමුදලේ දායකත්වය, සේවක භාරකාර අරමුදලේ දායකත්වය, සේවක, සේවිකාවන්ට ගෙවනු ලබන අවම වැටුප් සනාථ කිරීමට අදාළ ලේඛන)

09. පූර්ව සේවා සපයන ලද ආයතන පිළිබඳ විස්තර:

| ආයතනයේ නම | දුරකථන අංකය | කාල පරිච්ඡේදය |
|---|---|---|
| | | |
| | | |

10. “VAT” සඳහා ලියාපදිංචි අංකය:

11. 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද ලියාපදිංචි කිරීමේ සහතිකය සහ ද්වි වාර්ෂික බල පත්‍රය අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

....................................................................
කොන්ත්‍රාත්කරුගේ නම හා අත්සන
ජාතික හැදුනුම්පත් අංකය :
දිනය :

(නිල මුද්‍රාව තබන්න)

සාක්ෂිකරුවෝ:

1. අත්සන : ..................................................
   නම : ..................................................
   තනතුර : ..................................................
   ජාතික හැදුනුම්පත් අංකය : ..................................................

2. අත්සන : ..................................................
   නම : ..................................................
   තනතුර : ..................................................
   ජාතික හැදුනුම්පත් අංකය : ..................................................